# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 9,001—1942ක්වූ සැප්තැම්බර් මස 4 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

Nuwara Eliya No. 99.—මධ්‍යම දිසාවේ නුවරඑළිය පලාතේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1942ක්වූ ඔක්තෝබර් මස 19වෙනිවූ දිනවූ සඳුදා පෙරවරු 11ට නුවරඑළිය කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බද්දට දෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යොදනවා ඇත. මධ්‍යම දිසාවේ නුවරඑළිය පලාතේ කොත්මලේ කෝරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

මුල් සිතියමේ නො. P. P. A 438. ගම—මෙද්දෙගොඩ රංවිගම්මැද්ද.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | | | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|---|
| 13 | හොල්ලිනවත්ත .. | — | .. කේ. පඤ්ඤතිස්ස සාමිර. | .. තේ, අවුරුදු 18 .. | 0 | 0 | 9 | 600 |
| | | | ගම—මුවන්කෙලිඇල්ල. | | | | | |
| 64 | මකුරුනාය .. | — | .. පී. රනාණෙජි සාමිර | .. තේ, අවුරුදු 12 .. | 0 | 0 | 5 | 600 |

මේ 1942ක්වූ අගෝස්තු මස 24වෙනි දින කෑගල්ලේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එච්. ඊ. ජුන්ස්,
ඉඩම් පිළිබඳ අතිරේක කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

පොදු කටයුත්තකට, එනම්:—එල්ලක්කල ශේද්මාලයට මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවේ ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන පංශාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට හිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,141. ගම—එල්ලක්කල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | මිල්ලගහවත්ත .. | අවුරුදු 50ක් වයස පොල්ගස් 28ක්ද, අවුරුදු 5ක් වයස පොල්ගස් 7ක්ද, අවුරුද්දක් වයස පොල් පැල 12ක්ද, අවුරුදු 50ක් වයස කොස්ගහක්ද, අවුරුදු 5–15 වයස කොස්ගස් 3ක්ද, අවුරුදු 5ක් වයස රටදෙල්ගහක්ද, අවුරුදු 5–20 වයස පුවක්ගස් 61ක්ද, අවුරුදු 10ක් වයස පුළුන්ගස් 2ක්ද, අවුරුදු 30ක් වයස කිතුල්ගහක්ද, අවුරුදු 10ක් වයස බෙලිගහක්ද, අවුරුදු 1ක් වයස කොස් පැලයක්ද, කෙසෙල්පඳුරු 10ක් සහ මිශ්‍රෙන්ක පඳුරු ස්වල්පයක්ද, අඩිපාරවල් දෙකක කොටස්ද ඇති ඉඩම | කුරුප්පුආච්චිගේ සමනේරිස්, එම ජෝන්සිංඤෝ; එම ජූලිස් සිංඤෝ; එම කාමිනිස්, එම පබිලිස්, එම කරෝලිස්, එම පොඩිනෝනා සහ විරසූරිය ආරච්චිඅප්පුහාමිලාගේ ජන්සි නෝනා, එල්ලක්කල | 0 | 2 | 20·6 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා සයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1942ක්වූ ඔක්තෝබර් මස 3වෙනි දින පෙරවරු 10ට ඌරපොල ගම්සභාවේදී ඕ ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි. ඉහතකී ඉඩම ලබාගැනීම සම්බන්ධව මේ 1940 සැප්තැම්බර් මස 13වෙනි දින නොම්මර 8,660 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකළ දැන්වීම මෙයින් අවලංගුකළා ඇත.

මේ 1942ක්වූ අගෝස්තු මස 31වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඇස්. ඇස්. නවරත්නම්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කෑගළු දිස්ත්‍රික්කුවේ තලපිටියගම විශාලකිරීම පිණිස "ආණ්ඩුවේ ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන පංශාර්තුවල ප්‍රකාරයට, පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 401. ගම—තලපිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | මාගලගේවත්ත .. | අවුරුදු 30කට වඩා වයසැති පොල්වත්තක්.. | කොළඹ "බේලි නිවිස්" කොම්පැනියේ, දෙන් ඊවම් විශේෂවතින | 0 | 1 | 39 |
| 2 | — .. | පාර .. .. .. | එම .. .. | 0 | 0 | 20 |
| 3 | — .. | අඩිපාර .. .. .. | එම .. .. | 0 | 0 | 23 |
| 4 | මාගලගේවත්ත .. | අවුරුදු 30කට වඩා වයසැති පොල්වත්තක් (පුවක්ගස් 1,085ක්ද, කොස්ගස් 208ක්ද, අඹ ගස් 47ක්ද, දෙල්ගස් 32ක්ද, ලුනුමිදෙල්ලගස් 1ක්ද තිබේ, මේවායේ වයස අවුරුදු 10–30ත් අතරය; වරිච්චි බිත්තිවලින් සහ අතුවලින් සෙවිලිකරනලද තාවකාලික ගෙවල් 9ක්ද තිබේ) | එම .. .. | 26 | 3 | 8 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මනය, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 5 | ඉදිකඩබේගේන්යාය නො හොත් මැගලගේවත්ත | අවුරුදු 10–30ක් අතර වයසැති පුවක්ගස් 52ක්ද, කොස්ගසක්ද, කිතුල්ගසක්ද ඇති හේනක් | කොළඹ "බේලි නිවස්" කොම්පැනියේ, දෙන් ඒවඩ් බිජේමයින | 9 3 33 |
| 6 | මාගලගේවත්තේදෙනිය | කුඹුර .. .. .. | එම .. .. | 0 1 20 |
| 7 | — .. | අඹපාර .. .. .. | එම .. .. | 0 0 14 |
| 8 | මාගලගේවත්ත නො හොත් ඉදිකඩබේගේන් යාය | මාස 6ක් වයසැති තාවකාලික වගාවක් ඇති හේන | එම .. .. | 0 2 3 |
| 9 | මැදිකැලේ නොහොත් මාගලගේවත්ත | අවුරුදු 5ක් වයසැති කොස්ගසක් ඇති ලඳුකැලේ | එම .. .. | 37 2 10 |
| | | | | 76 0 1 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා 6වෙනි වගන්තියේ විධානකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

අයනයි ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම කමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වට 1942ක්වූ සැප්තැම්බර් මස 26වෙනි දින පෙරවරු 10ගේ කාහිසමට කෑගල්ලේ කච්චේරියේදී මා ඉදිරිපවවූ පැමිණ ඒ කොයි අකාරට අයිතිවාසිකමද කියා කියාසිටින්ට ඕනෑපී සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකාරකම් තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම 1942ක්වූ අගෝස්තු මස 31වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

එස්. එෆ්. අමරසිංහ,
කෑගල්ලෙ ආණ්ඩුවේ උප ඒජන්ත මමන.

---

## අනතුරු අඟවීම.

ඌව පළාතේ බදුලු දිස්ත්‍රික්කුවේ බන්ඩාරවෙල පදිංචි සිරිසේන බණ්ඩාර රත්නායක වන මම බදුලු දිස්ත්‍රික්කුවේ සිංහල භාෂාවෙන් කටයුතුකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු මෙන් පත්කරන පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගතවූපසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලුම්කරන බව නොතාරිස් පනතේ (පරිච්ඡේද 91) 1වෙනි උප ලෙඛනයේ "B" කොටසේ 2වෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඇස්. බී. රත්නායක.

බන්ඩාරවෙල.
17. 8. 1942

රත්නපුරේ පදිංචි කිරිබත්ගල ගුණතිලකතුමලාගේ සිරිවර්ධන යන මම කෑගලු දිස්ත්‍රික්කයෙහි සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු මෙන් පත්කරන ලෙස මෙවක් පටන් පුරා දෙමසක් ඉකුත්වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලුම්කිරීමට අදහස්කර සිටින බැව් වම් 1907වෙනි අංක 1 දරන ආඥාපණතේ "බී" උපලේඛනයේ 2වැනි ඡේදය යටතේ ආණ්ඩුවට සහ මහජනයාටත් මෙයින් දැනුම්දෙමි.

මෙයට,

K. K. Siriwardhena.

1942 අප්‍රේල් 15, රත්නපුර.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO